**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට **වනාතවිල්ලුව** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල නැතිවූ රු.42,270ක භාණ්ඩ තොගය සම්බන්ධයෙන් ගිණුම්වල අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී ජර්නල් සටහන් මගින් ඉවත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වනාතවිල්ලුව ළමා උද්‍යානය සහ එළුවන්කුලම සංචාරක බංගලාව පිහිටි අක්කර 01 රූඩ් 02 ක ඉඩම් වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාහන සේවා මධ්‍යස්ථානය සඳහා බාහිර පුද්ගලයෙකුගෙන් ලබාගත් රු.10,000ක් පමණ වටිනා මේ වනවිට අස්ථානගතවී ඇති වතුර මෝටරය සඳහා ගෙවිය යුතු වටිනාකම් පිළිබඳව ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු වටිනාකම් පිළිබඳව ගිණුම්වල හෙළිදරව් කල යුතුවේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.209,155,080 ක් වූ ගිණුම් විෂයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඔප්පු පැවරුම්පත්‍ර හා ශේෂ සනාථ කිරීම් ලබාගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත්කල යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

-------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,045,373ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු.2,662,719ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වරිපනම් බදු ලෙස රු.199,309 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමීක්ෂණයක් සිදු කර අක්කර බදු අයකර ගත යුතු ඉඩම් හඳුනා ගෙන නොතිබූ අතර රු.144,537 ක හිඟ ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (iii) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු එකතුව රු.77,760ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරීන්ට මේ සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය උපදේශ ලබාදී ඇති බව දන්වමි. | හිඟ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (iv) | ව්‍යාපාර ස්ථාන 03 ට අදාළව එකතුව රු.200,980 ක් වූ හිඟ බදු කුලී අයකර නොතිබුණි. | හිඟ වාරික අයකර ගැනිම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. | හිඟ කඩ කාමර කුලී කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය විධිවිධාන ගත යුතුවේ. |
| (v) | කුලී පදනම මත ලබා දුන් කඩ කාමර 21 කින් 2013 – 2020 කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු.502,918 ක හිඟ කුලී අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණු අතර කඩ කාමර නැවත පවරා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලි අය කිරිමට හැකි සියළුම ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අදාළ කඩ කාමර පිහිටි භූමිය ප්‍රාදේශිය ලේකම් විසින් පවරා දිමට කටයුතු නොකිරිම මත කඩ කාමර නැවත පවරා ගැනිම නොහැකිව වී ඇති බව දන්වමි. | හිඟ කඩ කාමර කුලී කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (vi) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 72කට අදාළව අයවිය යුතු හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.70,500ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නිලධාරීන්ට මේ සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව දන්වමි. | හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.3,209,301 ක් වටිනා ගොඩනැගිලි හා රු. 2,811,200 ක් වටිනා කායවර්ධන උපකරණ තොගයක් 2019 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | මෙම ගොඩනැඟිලි වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වෙමි. | වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) (i) | ප්‍රාදේශිය සභාවේ නිළධාරින් විසින් විටින් විට කරන ලද පරීක්ෂණවලදී 06 කණුව වාහන සේවා මධ්‍යස්ථානයේ සේවයේ යොදවා තිබුණු පුස්තකාල සහයක සේවයේ නොයෙදෙන බව තහවුරු වූවද, විනය ක්‍රියාමාර්ග නොගෙන 2020 වර්ෂයේ වැටුප් වශයෙන් රු.527,400 ක් ගෙවා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමාට වාර්තා කර ඇති අතර, ඉදිරියේදී මේ සම්බන්ධව පරීක්ෂණයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ඇතැයි අපේක්ෂා කරමි. | සේවක පරිපාලනයේදී පවත්නා නිතිරීති අනුගමනය කළ යුතුවේ. |
| (ii) | තවද, එම සේවා මධ්‍යස්ථානයේ තිබුණු රු.42,270ක් වටිනා භාණ්ඩ හා මුදල් තොගයක් නැතිවී ඇතත් ඊට වගකිව යුතු පුද්ගලයින් විගණිත දිනය වු 2021 මාර්තු 05 දින වන විටත් මූලික පරීක්ෂණයක් සිදු කර හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොලිසිය මගින් බී.ආර්.74443/2020 නඩු අංකය යටතේ පුත්තලම මහේස්ත්‍රාත් උසාවියට කරුණු වාර්තා කර ඇති බව පොලිස් වාර්තාවෙන් පෙන්නුම් කර ඇති බව දන්වමි. | පරීක්ෂණ පිළිබඳ පසු විපරමකර කඩිනමින් නිසි ක්‍රියා මාර්ග ගත යුතුවේ. |
| 3.2 | **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>** | | |
| | සභාව විසින් රු.4,238,610ක් වැයකර 2017 වර්ෂයේ දී ඉදිකර තිබුණු කසළ කළමනාකරණ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට නවතා දමා තිබූ අතර 2020 අගෝස්තු 19 දින නැවත ආරම්භ කර තිබුණි. සභාව විසින් දිනකට දිරන කසළ කිලෝ ග්‍රෑම් 305ක් පමණ එකතු කරනු ලැබුවද 2020 වර්ෂය තුලම නිෂ්පාදනය කර තිබුණේ පොහොර කිලෝ ග්‍රෑම් 250ක් බැවින් මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පූර්ණ ලෙස උපයෝජනය නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ බිම කොන්ක්‍රීට් කැඩී පළුදු වී තිබූ නිසා කොම්පෝස්ට් කරන ක්‍රියාවලිය නවත්වා තිබුණද 2020 වසරේ එය අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව නැවත ආරම්භ කරන ලදී. පවත්නා ශ්‍රමික හිඟය හේතුවෙන් දිරන කසළ කොම්පෝස්ට් කරන ක්‍රියාවලියට එම දිනයන්හිදීම ලක් කිරීම සිදුනොවේ. සතුන්ගෙන් එල්ල වන තරජන මත කසළ පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමටද නොහැකිවේ. | ව්‍යාපෘතියේ කටයුතු නොකඩවා ක්‍රියාත්මක කලයුතු අතර යන්ත්‍ර සූත්‍ර පූර්ණ ලෙස උපයෝජනය කල යුතුවේ. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රසම්පාදන තීරණ ගෙන නොතිබූ රු.1,317,050 ක් වටිනා ටයර් 19 ක් පෙර මිලදී ගත් සැපයුම්කරුවන්ගෙන් සභාපතිතුමාගේ අනුමැතිය මත මිලදීගෙන තිබුණි. | සභාවේ වාහන සඳහා ටයර් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී යම් යම් අඩුපාඩු වී ඇති බව පිළිගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුවේ. |